**ශීර්ෂය17- පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය**

**----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**1.1 තත්වාගණනය කළ මතය**

**--------------------------**

පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ **2019** දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත **2019** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයට අදාල වාර්ෂික කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 04 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් **2019** දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**-----------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි .

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය හා අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.3(අ) සහ 1.6.6 (ආ) (ii) ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ සම්බන්ධව පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

------------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර තිබූ ACA -5 ආකෘතිය අනුව අත්තිකාරම් ලැබීම් ලෙස දක්වා තිබූ රු.4,542,526 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා නොතිබුණි.තවද, අත්තිකාරම් ගෙවීම් ලෙස දක්වා තිබූ රු.5,256,043 ක් වෙනුවට එය රු.2,001,680 ක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතුය. | නිරීක්ෂණ හා එකග වෙමි. |

**1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට කාර්යාලයට අයත්ව තිබූ රු.9,100,000 වටිනා වෑන් රථය මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ඒසීඒ - 6 ආකෘතිය වන මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ද, ඒසීඒ-පී ආකෘතියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපොල පිරියත හා උපකරණ සහ දේපොල පිරියත හා උපකරණ සංචිතයෙහිද ඇතුලත් කර නොතිබුණි. | නිවැරදි වටිනාකම් ඊට අදාල අයිතමයට මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතුය. | වෑන් රථයේ වටිනාකම ඇතුලත් කර මූල්‍ය වාර්තා නිවැරදි කිරීමට උපදෙස් ලබාදෙන ලදී. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට, මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ඒසීඒ - 6 ආකෘතියෙහි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන අගයන් හා 2019 ජනවාරි 01 දිනට, මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ඒසීඒ - 6 ආකෘතියෙහි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන අගයන් අතර රු.224,229 ක වෙනසක් පැවතුණි. | 2018 දෙසැම්බර් 31 දිනට, මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 6 ආකෘතියෙහි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන අගයන් හා 2019 ජනවාරි 01 දිනට, මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ - 6 ආකෘතියෙහි මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන අගයන් හා සමාන විය යුතුය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පරිගණක තොරතුරු පද්ධතියේ දෝෂයක් මේ සඳහා හේතුවී ඇති අතර ඉදිරියේදී නිවැරදි කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව එකග වී ඇත. |
| (ඇ) 2019 වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.50,384 ක් ලෙස දක්වා තිබුනද , 2019 මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතියෙහි මිලදී ගැනීම් වටිනාකම ලෙස රු.398,041 ක් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොරතුරු ඇතුලත් කළ යුතුය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පරිගණක තොරතුරු පද්ධතියේ දෝෂයක් මේ සඳහා හේතුවී ඇති අතර ඉදිරියේදී නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇත. |
| (ඈ) 2019 වර්ෂයේදී පරිගණක උපාංග සහ ගෘහ භාණ්ඩ අපහරණයන් සිදුකර නොතිබියදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ - 6 ආකෘතියෙහි) වත්කම් අපහරණයන් (විකිණීම මගින්) යටතේ රු. 143,811 ක වටිනාකමක් ඉවත් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොරතුරු ඇතුලත් කළ යුතුය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පරිගණක තොරතුරු පද්ධතියේ දෝෂයක් මේ සඳහා හේතුවී ඇති අතර, ඉදිරියේදී නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇත. |

**1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු වැඩ තහනම් කළ නිලධාරියෙකුගේ රු. 128,800 ක්වූ ආපදා ණය ශේෂය සඳහා වර්ෂ 4 කට වැඩි කාලයක් ගත වී තිබුණි. | හිඟ ණය ශේෂය පියවා ගැනීමට කටයුතු කළයුතුය. | නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නීතිපතිතුමා වෙත යොමු කර ඇති අතර , නීතිපති දෙපාර්තමෙන්තුව විසින් ණය මුදල් ආපසු ගෙවන ලෙස ණයකරුට දන්වා ඇත. |
| (ආ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ-පී ආකෘතිය) ඇතුළත් 2019 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ශේෂය හා භාණ්ඩාගාර අත්තිකාරම් ශේෂය අතර තිබු රු.131,215 ක වෙනස සඳහා මූල්‍ය ප්‍රකාශනවල සැසඳීම් සිදුකර නොතිබුණි. | වෙනස සඳහා මූල්‍ය ප්‍රකාශනවල සැසඳීම් සිදුකල යුතුවේ. | නිරීක්ෂණ හා එකග වෙමි. |

**1.6.4 අග්‍රිම ශේෂය**

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම ගිණුමේ ඇති වූ වෙනස වන රු.3,034 ක මුදල ගැළපුම් ගිණුමක් මඟින් නිරවුල් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් ගිණුමක් මගින් අදාල වටිනාකම් නිරවුල් කළ යුතු වේ. | නිරීක්ෂණ හා එකග වෙමි. |

**1.6.5 මුල්‍ය ප්‍රකාශන සම්බන්ධ වෙනත් නිරීක්ෂණ**

-----------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-එෆ් ආකෘතිය අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වම්පස තිරුවෙහි 2019 වර්ෂයේ අයවැය සංඛ්‍යාත්මක අගයන් දැක්වීම වෙනුවට වර්ෂය අවසානයට සලසා ගෙන තිබුණු ශුද්ධ ප්‍රතිපාදන අගයන් ඇතුළත් කර තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වම්පස තිරුවෙහි 2019 වර්ෂයේ අයවැය සංඛ්‍යාත්මක අගයන් දැක්විය යුතු වේ. | 2019 වසර සඳහා සත්‍ය ප්‍රතිපාදන එක් එක් වැය විෂයය යටතේ සටහන් කර ඇත. |

**1.6.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (2)(අ) | සුළු මුදල් අතුරු අග්‍රිමයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 371(2)(අ) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී සුළු මුදල් අග්‍රිමයක් ලබාගෙන වියදම් දැරීම සඳහා උපදෙස් ලබාදී ඇත. |
| (ආ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009, 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛ | කාර්යාලයේ නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි . | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මීට පෙර අවස්ථා 5 කදී කරුණු දැක්වීම්වලට අමතරව වර්තමානයේ කොවිඩ් 19 පැතිරයාමේ අවධානම මත ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතය ප්‍රායෝගික නොවන බව නිරීක්ෂණය විය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 6 ඡේදය, 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) චක්‍රලේඛය, හා 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛය. | නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කල යුතු වුවත් එසේ කිරීමකින් තොරව පැමිණීමේ දීමනාව හා ඉතිරිකර ගත් නිවාඩු සඳහා වන දීමනා සඳහා රු. 2,114,960 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කාර්යාලයේ නිලධාරීන්ගේ පැමිණීම, පිටවීම කාර්යාලයේ රැඳී සිටීම මාගේ පෞද්ගලික අධීක්ෂණයට ලක්වේ. පැමිණීමේ ලේඛණය මෙන්ම ඒ ඒ නිලධාරියාගේ රාජකාරි කටයුතු පිරික්සීමෙන් පසු මෙම දීමනා ගෙවීම නිර්දේශ කිරීම හා අනුමැතිය ලබාදීම සිදු කරනු ලබයි. |
| (iii) | 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(iv) දරන චක්‍රලේඛය. | සභානායක ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් තනතුර වෙනුවෙන් අනුමත ඉන්ධන සීමාව ඉක්මවා 2015 ජනවාරි 16 දින සිට 2019 නොවැම්බර් දක්වා ඉන්ධන දීමනාව ලෙස රු.705,441 ක් වැඩියෙන් ගෙවා තිබීම. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සභානායක ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් තනතුරට අදාල ඉන්ධන සීමාව අදාල චක්‍රලේඛයේ සීමාව ඉක්මවමින් එම තනතුර දැරූ නිලධාරීන්ට අදාලව අමාත්‍ය මණ්ඩල පතිකාව අනුව ගෙවා ඇත.කෙසේ නමුත් එම නිලධාරියාට වර්තමානයේ ඉන්ධන ලීටර් 120 ක් පමණක් ලබා දෙන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති අංක **271/**2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව**,** බැදීම් හා බැරකම් ප්‍රකාශය මඟින් දක්වා ඇති බැරකම්, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂ වලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතුය.එලෙස වාර්තා නොකළ කිසිදු බැදීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස 2020 වර්ෂයේදී නිරවුල් නොකළ යුතු වුවද 2019 මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණු රු.18,415 ක බැරකම් 2020 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | බැදීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා ඇති වටිනාකම භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂ වලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතුය. | බැරකම් ලේඛණයේ නිවැරදිව සටහන් කර ඇති අතර සටහන් **V** මඟින් එම අගයන් ඉදිරිපත් කිරීම අතපසු වී ඇත. |

3. **මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත සේවක සංඛ්‍යාව 37 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 32 ක්වූ බැවින් පුරප්පාඩු 05 ක් පැවතුණි.